# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,005 - 2017 පෙබරවාරි මස 03 වැනි සිකුරාදා - 2017.02.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 374 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 378 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - කැලණිය අශෝකාරාම සිළුමිණි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 ජනවාරි මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී* ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 පෙබරවාරි මස 23 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 පෙබරවාරි මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


373- B 81141 — 5,403 (2017/02)
F 1 -

# පළාත් සභා නිවේදන

## පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව (වයඹ පළාත)

### රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්ථිර පදිංචි, ත්‍රිවිධ හමුදාවේ රණවිරුවන් සඳහා ඉඩම් බෙදාදීම සඳහා පවත්වන ඉඩම් කච්චේරි පිළිබඳ වූ නිවේදනයයි

1. පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම්පත්‍ර සලකා බැලීමට සහ ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසරපත්‍ර ලැබීමට සුදුසු තැනැත්තන් තෝරා ගැනීමට ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2017.05.18 යන දින ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

(අ) ඉඩමේ නම : රජයේ ඉඩම
(ආ) ඉඩමේ මැනුම් විස්තර : අ.ග.පි. 1157 කැබලි අංක 189
(ඇ) ඉඩම පිහිටි ගම : ඉහල වල්පොල
(ඈ) ග්‍රාම නිලධාරි කොට්ඨාසය හෝ කොට්ඨාස : 510 මැදගෙදර
(ඉ) උප දිසාපති හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසය : ඉබ්බාගමුව
(ඊ) දිස්ත්‍රික්කය : කුරුණෑගල
(උ) අන්සතු කිරීමට ඇති ඉඩමේ ස්වභාවය : ගොඩ ඉඩම
(ඌ) අන්සතු කරනු ලබන ඒකකය : පර්චස් 15 සිට පර්චස් 40 දක්වා

2. ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්ථිර පදිංචි 2008/4 චක්‍රලේඛය යටතේ ලියාපදිංචි වී ඇති පහත දැක්වෙන පංතියට හෝ පංතිවලට අයත් පුද්ගලයින්ගෙන් ලැබෙන ඉල්ලුම්පත්‍ර සලකා බලනු ලැබේ.

(1) ත්‍රිවිධ හමුදාවේ ස්ථිර සේවයේ යෙදී සිට ක්‍රියාන්විත රාජකාරියේ දී ආබාධිත වූවන්,
(2) ත්‍රිවිධ හමුදාවේ ස්ථිර සේවයේ සිට ක්‍රියාන්විත රාජකාරියේ දී මියගිය හා අතුරුදහන් වූවන්ගේ,

(අ) විවාහක නම් කලත්‍රයා හෝ අවිවාහක දරුවන්,
(ආ) අවිවාහක නම් මව හෝ පියා

ඉහත සඳහන් පංතියට හෝ පංතිවලට තමන් අයත් වන බව සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලැබිය හැකි සාධක ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතු ය.

3. සියලුම ඉල්ලුම්පත්‍ර 2017.04.28 වැනි දින හෝ ඊට පෙර ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉබ්බාගමුව වෙත ලැබිය යුතු ය. සියලුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියේ විය යුතු ය.

4. ඉල්ලුම්කරු ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේ නම් 2017.05.18 යන දින ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම් ඔහුට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට කැමති සෑම තැනැත්තෙක්ම පෞද්ගලිකව පැමිණිය යුතු ය. එසේ නැතහොත් තමා නියෝජනය කිරීම සඳහා වෙනත් අයෙකු ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතු ය.

5. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරන තැනැත්තා හෝ විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලුම සාධක හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන වෙනත් අදාළ තොරතුරු ඉඩම් කච්චේරියේ දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

6. තෝරාගනු ලබන සෑම ඉල්ලුම්කරුවකුටම මුල් අවස්ථාවේ දී අවසර පත්‍රයක් ලැබෙන අතර එහි සඳහන් කොන්දේසිවලට යටත් වනු ඇත.

7. අවසර පත්‍රයක් ලැබීමට තෝරාගනු ලබන සෑම තැනැත්තෙක්ම එසේ තෝරාගනු ලැබූ බව දන්වනු ලැබූ වහාම තමන් තෝරාගනු ලැබ ඇත්තේ කවර ඉඩමක් සඳහා ද එම ඉඩම වෙනුවෙන් පර්චසයකට රු. ................ බැගින් ගණන් බලනු ලබන මුදලක් තැන්පත් කළ යුතු වේ. මෙම තැන්පතුව ආපසු නොගෙවනු ලබන නමුත් තේරුණු තැනැත්තා විසින් ගෙවිය යුතු ගැණුම් මුදලට එය හිලව් කරනු ලැබේ.

8. ඉහත සඳහන් ඉඩම් කච්චේරිය පිළිබඳ විස්තර පහත දැක්වෙන තැනැත්තන්ගේ ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති ස්ථානවලදී ලබාගත හැක :

(i) පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ), පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය, කුරුණෑගල
(ii) ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉබ්බාගමුව

අයි. එම්. අයි. ඉලංගකෝන්,
ඉඩම් කොමසාරිස් (වයඹ).

2017 ජනවාරි මස 16 වැනි දින දී ය.

ඉල්ලුම්පත්‍රයේ සහ දිවුරුම් ප්‍රකාශයේ ආදර්ශ ආකෘති පහතින් දක්වා ඇත :

**රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්ථිර පදිංචි, ත්‍රිවිධ හමුදාවේ රණවිරුවන්ට ඉඩම් බෙදාදීම සඳහා තෝරාගනු ලැබීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය**

01. සම්පූර්ණ නම :...................................................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය :...................................................................................

03. (i) ලිපිනය :...................................................................................................

(ii) ඡන්ද බලය ලබාගෙන ඇති මැතිවරණ කොට්ඨාසය :.......................................................

(iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසය :...................................................................................

04. ගෘහ මූලික අංකය :...........................................................

05. ස්ත්‍රී/පුරුෂ භාවය :...........................................................

06. වයස (අයදුම්පත් භාරගන්නා අවසන් දිනට) :...........................................................

07. උපන් දිනය :...........................................................

08. විවාහක/අවිවාහක බව :...........................................................

09. රැකියාව :...................................................................................................

10. රැකියාව කරන ස්ථානය :...................................................................................

11. අයදුම්කරු, කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) ඇතුළු මුළු පවුලේ වාර්ෂික ආදායම :

| නම | අයදුම්කරුට ඇති සම්බන්ධය | රැකියාව | වාර්ෂික ආදායම (රුපියල්) |
|---|---|---|---|
| (1) | | | |
| (2) | | | |
| (3) | | | |
| (4) | | | |

12. ඉල්ලුම්කරු සහ යැපෙන්නන් සතු ඉඩම් පිළිබඳ විස්තර :

| ඉඩමේ නම | ප්‍රමාණය | අයිතියේ ස්වභාවය | හවුලේ පරවේණි ඉඩමක් නම් පවුලේ අයට හිමි කොටස් |
|---|---|---|---|
| (1) | | | |
| (2) | | | |
| (3) | | | |

(නිවාස සහ දේපළ උපරිම පනත යටතේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු ය.)

13. කලත්‍රයාගේ (පුරුෂයා හෝ භාර්යාව) රාජකාරි ලිපිනය :..........................................................................................................

14. දැනට තමා පදිංචි නිවසේ තත්ත්වය :..........................................................................................................
(තමාගේ ද?/බද්දට ද?/අනවසරයෙන් ද? යන වග)

15. නිවස පිහිටි ස්ථානය :..........................................................................................................

16. යැපෙන දරුවන්ගේ විස්තර :..........................................................................................................

17. ඉගෙනුම ලබන දරුවන් පිළිබඳ විස්තර :

| නම | වයස | ඉගෙනුම ලබන පාසලේ නම | ඉගෙනුම ලබන පංතිය/ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

18. ඔබ හෝ කලත්‍රයා විසින් ඉඩමක් හෝ නිවසක් මිල දී ගැනීම සඳහා රජයෙන් හෝ සේවය කරන ආයතනයෙන් ණය මුදලක් ලබාගෙන ඇත් ද? එසේ නම් පහත විස්තර සපයන්න :

1. ලබාගත් ණය මුදල :..........................................................................................................
2. ණය ලබාගත් ආයතනය :..........................................................................................................
3. දැනට ගෙවීමට ඇති ශේෂය :..........................................................................................................

19. පවුලේ යම් සාමාජිකයෙකු මුදල් ඉතිරි කර තිබේ ද? තිබේ නම් පහත විස්තර සපයන්න :

| පවුලේ සාමාජිකයාගේ නම | ඉතිරි කිරීමේ ගිණුම පවත්වාගෙන යන ආයතනය | ඉතිරි කළ මුදල |
|---|---|---|
| | | |
| | | |
| | | |

20. ඉඩම්ලාභියකු වශයෙන් යථා කාලයේ දී තෝරාගනු ලැබුවහොත් ඉඩමේ වටිනාකම රජය තීරණය කරනු ලබන අන්දමට ගෙවීමට එකඟ වන අතර, ඉඩම බදු ගැනීමෙන් අනතුරුව මාස 06 ක කාල සීමාවක් තුළ ඉඩම ප්‍රමාණවත් පරිදි සංවර්ධනය කිරීමට එකඟ වෙමි. මා විසින් ඉදිරිපත් කරන තොරතුරු, තෝරා ගැනීමෙන් පසුව වුව ද අසත්‍ය බව හෙලිවුවහොත් මාගේ තෝරා ගැනීම ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකි බවත් දනිමි.

.........................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

ඉහත අයදුම්කරු විසින් ඡේද 1 සිට 19 දක්වා ප්‍රකාශ කර ඇති තොරතුරු මා පරීක්ෂා කළ බව ද, එම තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

.........................................,
ග්‍රාම නිලධාරිගේ අත්සන.

නම :—————.
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :—————.

අනු අත්සන් කරමි.

..............................................,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන.

*දිවුරුම් ප්‍රකාශයයි*

.................................... දිස්ත්‍රික්කයේ .................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ........................... ග්‍රාම නිලධාරි වසමේ .............................. පදිංචි ........................................... වන මම, පහත සඳහන් පරිදි දිවුරා ප්‍රකාශ කරමි.

(1) මට ද, මාගේ භාර්යාවට ද සහ වයස අවුරුදු 18ට අඩු මාගේ දරුවන්ට ද, සාමූහිකව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම් සහ පුද්ගලික ඉඩම් ද ඇතුළුව) අක්කර 50කට (පනහකට) අඩුවෙන් තිබෙන බවට සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට හෝ 1973 අංක 01 දරන නිවාස දේපළ උපරිම පනත යටතේ හෝ ප්‍රකාශයක් කර නැති බවට ද සහතික කරමි.

(2) එසේම ඉහත කී අක්කර .............. රූඩ්................ පර්චස් ................ පමණ වූ මෙම ඉඩම පවරා ගැනීමේ/මිල දී ගැනීමෙන් පසුව වුව ද, ඉහත ඡේදයේ සඳහන් කර ඇති අක්කර පනහේ සීමාව නොඉක්මවන බවත්, නිවාස දේපල උපරිම පනත යටතේ සීමාවන් නොඉක්මවන බවටත් වැඩිදුරටත් මෙයින් සහතික කරමි.

.......................................,
දිවුරුම්කරු.

ඉහත සඳහන් දිවුරුම්කරුට/කාරියට මෙහි අඩංගු දෑ කියවා තේරුම්කර දුන් අතර, ඔහු/ඇය මෙහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගැනීමෙන් පසුව මා ඉදිරියේ දී අත්සන් තැබූ බවත් සහතික කරමි.

....................................................,
සාමදාන විනිශ්චයකාර තැන.

02-293

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## වයඹ පළාත් සභා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරි බණ්ඩ 2 සේවක ගණයෙහි පරිවාස නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017

වයඹ පළාත් සභා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරි බණ්ඩ 2 සේවක ගණයෙහි පරිවාස නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ලත් වයඹ පළාතේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

01. මෙම විභාගය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2017 මැයි මස දී කුරුණෑගල නගරයේ පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානයක දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ. විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

02. *වැටුප් ක්‍රමය.-* 2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන 1 අනුව මෙම තනතුරට අදළ මාසික වැටුප් පරිමාණය MN-5-2016 අනුව ; රු. 34,605-10 x 660 - 11 x 755 - 15 x 930 - 63,460 වේ.

නමුත් 2020.01.01 දක්වා ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

(එය 2017.01.01 දින සිට මූලික වැටුප - රු. 23,874/- + ගැලපුම් දීමනාව රු. 6,190 පරිදි වේ.)

03. (අ) *අධ්‍යාපන සුදුසුකම්.-*

i. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ/ඉංග්‍රීසි හා ගණිතය ඇතුළු තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් හයකින් (06) කින් එකවර සමත් වී තිබීම.

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී විෂයයන් තුනක් (03) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

iii. සමාජ විද්‍යාව, මනෝ විද්‍යාව, දර්ශනය, අපරාධ විද්‍යාව, නීතිය යන විෂයයන්ගෙන් එක් විෂයයක් හෝ ඇතුළත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

(ආ) *කායික සුදුසුකම්.-*

සෑම අපේක්ෂකයෙකුම වයඹ පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(ඇ) *වෙනත් සුදුසුකම්.-*

1. පූර්වාසන්න වසර තුනක කාලය තුළ වයඹ පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

ii. අයදුම්කරුවන් යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

iii. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් 2017.04.07 දිනට සම්පූර්ණ කර සහතික ලබා තිබිය යුතු ය.

iv. 2017.04.07 දිනට වයස් සීමාව අවුරුදු 21 ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය.

04. *සේවා කොන්දේසි.-*

i. මෙම තනතුර ස්ථිර ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු ය.

ii. මෙම තනතුරට පත් කරනු ලබන්නන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර ඔහු/ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ සහ හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවෙනි

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබේ නම් හා අනෙකුත් සේවය ස්ථිර කිරීම සඳහා වන අවශ්‍යතාවයන් සම්පූර්ණ කර තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.

iii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව සේවයට බැඳී වසර 05ක් ඇතුළත සේවයට බැඳුනු භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව/භාෂා පිළිබඳ ප්‍රවීණතාව ලබාගත යුතු ය.

iv. මෙම තනතුර සඳහා වූ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, වයඹ පළාත් මුල්‍ය රීති සංග්‍රහය, වයඹ පළාත් විනය කාර්ය සංග්‍රහය, වයඹ පළාත් සභා කාර්ය පරිපාටික රීති, දෙපාර්තමේන්තු නියෝග හා රජය හා වයඹ පළාත් සභාව විසින් පනවනු ලබන වෙනත් විධිවිධානවලට යටත් විය යුතු ය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය.-* වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විභාගයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කෙරේ. පුරප්පාඩු තනතුරු සංඛ්‍යාවෙන් 70%ක් මෙම විභාගයේ ප්‍රතිඵල මත පුරවනු ලැබේ. විභාගය සමත්වීම සඳහා විභාග විෂය නිර්දේශයේ දක්වෙන එක් එක් ප්‍රශ්න පත්‍රයට 40%ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත යුතු ය. ලිඛිත විභාගයෙන් විෂයයන් දෙකම සමත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත විභාගයේ හා ව්‍යුහගත පරීක්ෂණයේ ලකුණු ප්‍රමුඛතාව අනුව බඳවා ගැනීම් සිදු කෙරේ.

06. *විභාග ක්‍රමය.-* විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පැවැත්වෙන අතර, ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

6.1 ලිඛිත තරග විභාගයට අදාළ විස්තර පහත පරිදි වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. විෂයානුබද්ධ දැනුම | පැය 02 | 100 | 40 |
| 2. අභියෝග්‍යතාවය | පැය 01 | 100 | 40 |

6.2 *විෂය නිර්දේශය.-*

1. විෂයානුබද්ධ දැනුම

   1. ශ්‍රී ලංකාවේ ළමුන් ආශ්‍රිත සමාජ ප්‍රශ්න
   2. ළමුන්ගේ ශාරීරික මානසික වර්ධනය
   3. ළමා අපයෝජනය/අයිතිවාසිකම්
   4. ළමුන් සම්බන්ධ නීති හා කාලීන ප්‍රවණතා පිළිබඳ දැනුම

2. අභියෝග්‍යතාවය

   නිලධරයාගේ භාෂා හැකියාව, තර්කන හැකියාව, තීරණ ගැනීමේ හැකියාව හා ගණිතමය කුසලතාවය මැන බැලෙන බහුවරණ හා ව්‍යුහගත ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

07. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය.-*

| *ලකුණු ලබා දෙන ක්ෂේත්‍රයන්* | *උපරිම ලකුණු* |
|---|---|
| 1. අධ්‍යාපන සුදුසුකම්<br><br>විශ්ව විද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජ විද්‍යාව/දර්ශනය/නීතිය/මනෝ විද්‍යාව/අපරාධ විද්‍යාව යන විෂයයක් ඇතුළත්ව,<br>පශ්චාත් උපාධියක් ලබා තිබීම - ලකුණු 25<br>පශ්චාත් ඩිප්ලෝමාවක් ලබා තිබීම - ලකුණු 15 | 25 |

| *ලකුණු ලබා දෙන ක්ෂේත්‍රයන්* | *උපරිම ලකුණු* |
|---|---|
| බඳවා ගැනීමේ මූලික සුදුසුකම වන උපාධිය සඳහා<br><br>පළමු පෙළ සාමාර්ථය - ලකුණු 20<br>දෙවන පෙළ (ඉහල) - ලකුණු 15<br>දෙවන පෙළ (පහල) - ලකුණු 12<br>සාමාන්‍ය සාමාර්ථය - ලකුණු 10 | 20 |
| 2. තනතුරට අදාළව ක්ෂේත්‍රයේ ලබා ඇති පුහුණුව<br><br>i. සමාජ සේවා විද්‍යාලයෙන් ලබා ඇති දෑ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලා සහතිකය - ලකුණු 20<br><br>ii. ස්වේච්ඡා පරිවාස නිලධාරි තනතුරක වසර 02ක සේවා කාලයක් සපුරා තිබීම (විවෘත තරඟ විභාගයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා පමණි) - ලකුණු 10 | 30 |
| 3. ක්ෂේත්‍රයට අදළව හදරා ඇති වෙනත් පාඨමාලා<br><br>මුල් ළමා විය සංවර්ධනය සම්බන්ධයෙන් විවෘත විශ්ව විද්‍යාලයේ හෝ වයඹ පළාත් පෙර පාසැල් ගුරු පුහුණු මධ්‍යස්ථානයේ අවම වශයෙන් වසර 1ක ඩිප්ලෝමා පාඨමාලාවන් හදරා තිබීම. | 15 |
| 4. ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතා<br><br>අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ඉංග්‍රීසි විෂයයට විශිෂ්ඨ සාමාර්ථයක්/ උසස් තාක්ෂණ ආයතනය හෝ ඒ හා සමාන රජයේ පිළිගත් ආයතනයක වසරකට නොඅඩු ඉංග්‍රීසි පාඨමාලාවක් හදරා තිබීම - ලකුණු 10<br><br>අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ඉංග්‍රීසි විෂයයට සම්මාන සාමාර්ථයක්/ රජයේ පිළිගත් ආයතනයක මාස 6කට නොඅඩු ඉංග්‍රීසි පාඨමාලාවක් හදරා තිබීම - ලකුණු 07<br><br>අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ඉංග්‍රීසි විෂයයට සම්මාන සාමාර්ථයක්/ රජයේ පිළිගත් ආයතනයක මාස 3කට නොඅඩු ඉංග්‍රීසි පාඨමාලාවක් හදරා තිබීම - ලකුණු - 05 | 10 |
| මුළු ලකුණු | 100 |

08. විභාග ගාස්තු වශයෙන් රු. 500ක් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13ට බැර වන පරිදි තමුන් පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබාගන්නා ලද ව.ප.ස.මු./2 ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතු ය. එසේ මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ආයතනවලට ගෙවා ලබාගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර, කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බව සැළකිය යුතු ය. (රිසිට්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

09. *ඉල්ලුම් කළ යුතු පිළිවෙල.-*

9.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A 4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කරගත යුතු ය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2017.04.07 වැනි දින හෝ එදිනට ප්‍රථම ''ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ

කෙළවරෙහි, ''වයඹ පළාත් සභා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017'' යනුවෙන් සඳහන් කළ යුතු ය.

9.2 දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.

9.3 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති, ප්‍රමාද වී ලැබෙන, අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තව ද, සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව විමසා බැලීම අයදුම්කරු සතු වගකීමකි. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරු විසින්ම දරාගත යුතු ය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

10. මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා නොමැති අයගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදළ ලිපි ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය. සෑම අයදුම්රුවෙක්ම තනතුරට අදළ සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

11. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය.*- අපේක්ෂකයින් තමා පෙනී සිටින සෑම විෂයයක් සඳහාම තම අනන්‍යතාවය පහත සඳහන් ලියවිලිවලින් විභාග ශාලාධිපතිට තහවුරු කළ යුතු ය.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

***සටහන.***- විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වුවහොත් ඔවුන් විභාගයට පෙනී සිටීම සඳහා නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

12. කිසියම් අපේක්ෂකයෙකුට සිය ප්‍රවිශ පත්‍රය විභාගයට යටත් පිරිසෙයින් දින 07 කට පෙර නොලැබුනහොත් ඒ බව වහාම ''ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල'' යන ලිපිනයට දැන්විය යුතු යි. එසේ දැනුම් දීමේ දී පහත විස්තර ඉදිරිපත් කළ යුතු ය.

*(අ)* විභාගයේ නම :————.
*(ආ)* අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————.
*(ඇ)* ලිපිනය :————.
*(ඈ)* අයදුම්පත්‍රය යොමු කළ ලිපිනය, ලියාපදිංචි තැපෑලේ අංකය හා දිනය :————.

13. යම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. පත්වීම් ලැබීමෙන් පසු හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

14. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදළ කරුණු හෝ එම නිවේදනයෙන් අනාවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

15. මෙම විභාගය පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳ හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම් කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳ අවසාන තීරණය ද වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ය.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

කාන්ති වේහැල්ල,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2017 ජනවාරි,
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව (වයඹ),
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*වයඹ පළාත් සභා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරි ඛණ්ඩ 2 සේවක ගණයෙහි පරිවාස නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017*

විභාග අංකය : ☐

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. 1.1 මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :..........................................................................

..........................................................................................................

1.2 මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................

..........................................................................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :..........................................................................

..........................................................................................................

1.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................

..........................................................................................................

1.5 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

02. 2.1 ස්ථිර ලිපිනය :..........................................................................

..........................................................................................................

2.2 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :..........................................................................

2.3 දුරකථන අංකය : පෞද්ගලික :.................................................. රාජකාරි :..................................................

03. ස්ත්‍රී/පුරුෂ භාවය : (අදාළ කොටුව තුළ "X" ලකුණ යොදන්න.)

ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

04. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල : ☐ දෙමළ : ☐ ඉංග්‍රීසි : ☐

05. උපන් දිනය : වර්ෂය :.................. මාසය :.................. දිනය :..................

06. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2017.04.07 දිනට වයස : අවුරුදු :.................. මාස :.................. දින :..................

07. 2017.04.07 දිනට වයඹ පළාතේ ස්ථිර පදිංචිය : අවුරුදු :...................... මාස :...................... දින :......................

08. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් : (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 3 (අ) හි සඳහන් පරිදි,

අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය හා විභාග අංකය :

වර්ෂය :.................................... විභාග අංකය :....................................

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය හා විභාග අංකය ඃ

වර්ෂය ඃ..................................... විභාග අංකය ඃ.......................................

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |

*ලබා ඇති උපාධිය පිළිබඳ විස්තර ඃ*

උපාධිය ඃ..............................................................................................................
විශ්වවිද්‍යාලය ඃ..............................................................................................................
හදරා ඇති විෂයයන් ඃ..............................................................................................................
උපාධිය වලංගුවන දිනය ඃ..............................................................................................................

09. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය ඃ.....................................................................
දිනය ඃ.................................................
ලදුපත් ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඃ.................................................

| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න. |
|---|

10. *අයදුම්කරුගේ සහතිකය ඃ*

.................................................................. වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ................ හා ..........................වැනි දින දරන ලදුපත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද, විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද් දී හෝ ඉන් පසුව හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු

ලබන තීරණයකට මම එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

.............................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :..................................

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ......................................................................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය ................................................ දින මා ඉදිරිපිටදී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

සහතික කරන අයගේ නම :...............................................
අත්සන :...............................................
තනතුර හා නිල මුද්‍රාව :.....................................................

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සමාදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 2,40,360කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන, ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.)

**රජයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**
(අනවශ්‍ය වචන කපා හරින්න.)

................................................................... මයා/මිය/මෙනවිය දැනට ........................................................... අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ආයතනයේ .............................................................. වශයෙන් ස්ථිර සේවයේ යෙදී සිටින බවත්, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවත්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගන්වා ඇති/නැති බවත්, තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා ඇති/නැති බවත් සහතික කරන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකි ය/නොහැකි ය.

...............................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

දිනය :..........................................

02-190

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
# සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු.* | *ශ.* |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2017** | | | |
| **පෙබරවාරි** | 2017.02.03 | සිකුරාදා | 2017.01.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.02.09 | බ්‍රහස්පතින්දා | 2017.01.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.02.17 | සිකුරාදා | 2017.02.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.02.23 | බ්‍රහස්පතින්දා | 2017.02.09 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2017.03.03 | සිකුරාදා | 2017.02.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.03.10 | සිකුරාදා | 2017.02.23 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2017.03.17 | සිකුරාදා | 2017.03.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.03.24 | සිකුරාදා | 2017.03.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.03.31 | සිකුරාදා | 2017.03.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අප්‍රේල්** | 2017.04.07 | සිකුරාදා | 2016.03.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.04.12 | බදාදා | 2016.03.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.04.21 | සිකුරාදා | 2017.04.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.04.28 | සිකුරාදා | 2017.04.12 | බදාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.).*

2017 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.